**ගාල්ල මහා නගර සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 දෙසැම්බර් 26 දින සුනාමි ව්‍යසනයෙන් සභාවේ දේපලවලට සිදුව තිබුණු හානි / පාඩු ගණනය කර ගිණුම් ගැලපීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) රු.4,811,101 ක් වූ ස්ථාවර තැන්පතු 05 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ හීන්පැන්දල කසල ඉඩමේ කොම්පෝස්ට් පොහොර අංගනයේ වහලය ඉදිකිරීම සඳහා ගෙවා තිබූ රු.412,394 ක් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වැය ලෙස නොදක්වා පුනරාවර්තන වැය ලෙස දක්වා තිබීම නිවැරදි කිරීමේ දී එම වටිනාකම ලී බඩු හා සවිකිරීම් ගිණුමට හර කර, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ලී බඩු හා සවිකිරීම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුම රු.412,394 බැගින් වැඩියෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී මිල දී ගන්නා ලද රු.1,289,620 ක් වූ ස්ථාවර වත්කම් හා රු.23,644 ක පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) නාගරික සංවර්ධන අධිකාරියේ ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය රු.5,175,928 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.6,494,449 ක් වීමෙන් රු.1,318,521 ක් වැඩියෙන් දැක්විණි.

(ඊ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.4,374,429 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.3,702,861 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් හා ණයගැතියන් රු.671,568 කින් අඩුවෙන් දැක්විණි.

(උ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.788,500 ක් වටිනා පරිගණක හා උපාංග පුනරාවර්තන වියදම් ලෙස සටහන් කිරීම නිසා යන්ත්‍ර සූත්‍ර උපකරණ ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.788,500 බැගින් අඩුවෙන් දැක්විණි.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

(අ) ගිණුම් විෂයයන් 04 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.5,866,610 ක වෙනසක් පැවතුණි.

(ආ) ගිණුම් විෂයයන් 05 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.262,683,396 ක් වුවද, ඊට අදාල උපයෝගී ලේඛන තුලනය කර නොතිබුණි. ඒ අනුව පාලන ගිණුම්වල ශේෂයන් උපයෝගී ලේඛන සමඟ සැසඳිය නොහැකි විය.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

1999 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.111,553 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 ලැබිය යුතු ගිණුම්

ඉදිරියට ගෙන එමින් පැවති වර්ෂ 06 කට වඩා පැරණි රු.900,178 ක් වූ වත්කම් ශේෂ 04 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.539,255,296 ක් වූ ගනුදෙනු සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, විධිමත්ව පවත්වාගෙන ගිය ණයගැති / ණයහිමි ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

### 1.3.7 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

සභාවේ 2015 වර්ෂයට අදාල අයවැය ලේඛනය 2014 දෙසැම්බර් 19 දින මහා නගර සභා කාර්යාලයීය සභා ශාලාවේ දී සම්මත කරගෙන තිබූ අතර, මහා නගර සභා ආඥා පනතේ 188(1)(ඉ) වගන්තියේ නියමයන්ට පටහැනිව හික්කඩුවේ හෝටලයක 2014 දෙසැම්බර් 20 දින පවත්වන ලද රාත්‍රී සාදයක් වෙනුවෙන් එකී හෝටලයට 2015 ජනවාරි 28 දින රු.191,432 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. එමෙන්ම සාදය වෙනුවෙන් සහභාගී වූවන් පිළිබඳව විස්තර විගණනයට ඉදිරිපත් නොවූ අතර රු.191,432 ක් වූ වියදම 11476 - අන්තර් ජාතීන් හා වෙනත් විදේශ සංවිධාන වෙත ග්‍රාහක මුදල් හා සාමාජික මුදල් ගෙවීම යන වියදම් සංකේතය මගින් වැයකර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ පුනරාවර්තන වියදමට වඩා අඩුවූ ආදායම රු.40,584,412 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.46,628,525 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අය කර ගත යුතුව තිබූ රු.76,529,936 ක් වූ වරිපනම් බදු මහා නගර සභා ආඥා පනතේ 252(1)(අ) සහ (ආ) වගන්තිවල විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 වෙළඳ බලපත්‍ර සහ බදු කුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අය කර ගත යුතුව තිබූ රු.2,825,649 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු සහ රු.21,712,074 ක් වූ බදු කුලී මහා නගර සභා ආඥා පනතේ 254(අ)(1) සහ (2) වගන්තිවල විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු. 3,702,861 ක උසාවි දඩ හා රු. 24,023,511 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

1988 අංක 74 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව නගරාධිපතිවරයා ඇතුළු සියළුම නාගරික සභිකයින් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දියයුතු වුවද, නගරාධිපතිවරයා සහ සභිකයින් 17 දෙනෙකු විසින් 2014 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි. එමෙන්ම 2013 වර්ෂය සඳහා නගරාධිපතිවරයා සහ සභිකයින් 15 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ඉඩම් වෙන්දේසි**

------------------

සභා බලප්‍රදේශය තුළ පිහිටි අක්කර 01 යි, රූඩ් 01 යි, පර්චස් 7.5 ක් වූ අංක 20, කිතුලම්පිටිය පාර ඉඩම එක්තරා සමාගමක් විසින් වෙන්දේසි කර තිබූ අතර, මහා නගර සභා ආඥා පනතේ 247 ඉ(1) වගන්තිය අනුව ගෙවිය යුතු සියයට 1 ක බදු මුදල රු.444,983 ක් වුවද, සභාව අය කරගෙන තිබූ මුදල රු.386,076 ක් විය. මේ අනුව සභාව විසින් රු.58,907 ක බදු ආදායමක් අය කරගෙන නොතිබුණි.

**(ආ) අගරු චෙක්පත්**

------------------

ආදායම් අය කිරීමේ දී ලබා ගන්නා ලද රු.680,615 ක් වූ චෙක්පත් 20 ක් අගරු වී තිබුණ ද, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 සහ 486 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එමෙන්ම රු.55,473 ක් වූ හඳුනා නොගත් අගරු චෙක්පත් පිළිබඳව සොයාබලා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 හඳුනාගත් අලාභ**

---------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් මාසය තුළදී 1" ගැල්වනයිස් බට 512 ක් සභාව වෙත ලබා දී තිබුණි.

(i) සභාව වෙත ලැබී තිබුණු ගැල්වනයිස් බට 512 ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ii) 2015 අප්‍රේල් 06 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී බට 417 ක් පමණක් පැවති බව තහවුරු වූ අතර, ඒ අනුව බට ඌණතාවයේ වටිනාකම රු.105,165 ක් විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

### 4.2 පිළිතුරු නොදුන් විගණන විමසුම්

------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 05 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය